ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියාව ශ්‍රී ලංකා පොලිසිය වෙත ධාරිතා ගොඩනැගීමේ පුහුණු වැඩසටහන් රැසක් පිරිනමයි</u>

ශ්‍රී ලංකා පොලිසියේ ඉල්ලීමක් අනුව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියාවේ ප්‍රමුඛ පෙළේ පුහුණු ආයතන වන ජයිපූර් හි මධ්‍යම රහස් පරීක්ෂක පුහුණු ආයතනය (CDTI), හයිඩ්‍රාබාද් CDTI, කල්කටා හි CDTI සහ මනේසාර්හි ජාතික ආරක්ෂක බලකාය (NSG) යන ආයතනවල විශේෂයෙන්ම සැකසූ ධාරිතා ගොඩනැගීමේ පුහුණු පාඨමාලා සඳහා අවස්ථාව ලබා දේ.

2. ඉන්දියාව ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය සහිත විවිධ පුහුණු පාඨමාලා නිරන්තරයෙන් සංවිධානය කරයි. 2024 වසරේ ආරම්භයේ දිට මේ දක්වා කණිෂ්ඨ, මධ්‍යම සහ ජ්‍යේෂ්ඨ මට්ටමේ පොලිස් නිලධාරීන් 60 දෙනෙකුට අධික පිරිසක් අපරාධ ස්ථාන කළමනාකරණය, කෘත්‍රිම බුද්ධිය සහ සයිබර් අපරාධ පරීක්ෂණ සහ ප්‍රභූ ආරක්ෂක පුහුණුව වැනි විවිධ විෂය ක්ෂේත්‍ර ඔස්සේ පැවැත්වූ පුහුණු පාඨමාලා සඳහා සහභාගී වී ඇත. මෙම පාඨමාලා ඉන්දීය රජය විසින් ඉන්දියානු තාක්ෂණ සහ ආර්ථික සහයෝගීතා (ITEC) වැඩසටහන සහ 'ශ්‍රී ලංකාවට සහයෝගය' යන වැඩසටහන යටතේ පිරිනමනු ලබයි. ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් 130කට අධික සංඛ්‍යාවක් මෙම වසරේදී පුහුණුව ලැබීමට නියමිතය.

3. ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් 23 දෙනෙක් ජූනි 18 වන දින ආරම්භ වන දෙසතියක විශේෂ පාඨමාලාවක් සඳහා මෑතක දී නවදිල්ලිය බලා පිටත් විය. දිවයිනෙන් පිටත් වීමට පෙරාතුව මෙම පිරිස ජූනි 13 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ශ්‍රී සන්තෝෂ් ජා මහතා හමු විය. මේ වන විට එම පිරිස ත්‍රස්ත මූල්‍යකරණය, අභ්‍යන්තර ආරක්ෂක ගතිකයන්,

ඉස්ලාමීය සහ වෙනත් ආගමික අන්තවාදීකරණයන් වැනි විවිධ විෂය කෂේත්‍ර ඔස්සේ NIA හි පුහුණුව ලබයි.

***

*කොළඹ*
*2024 ජූනි 21*